නිපුණතාව 3.0 – සාම්ප්‍රදායික තර්ක ශාස්ත්‍රයේ අව්‍යවහිත හා ව්‍යවහිත අනුමාන ඇසුරින් (අනාගත ස්වභාවය පිළිබඳ) නිගමනවලට එළඹෙයි.

නිපුණතා මට්ටම 3.2 – සාම්ප්‍රදායික තර්ක ශාස්ත්‍රයේ අනුමාන ඇසුරෙන් සප්‍රමාණ නිගමනවලට එළඹෙයි.

1.විශේෂ සාධ්‍ය අවයවයකින් හා ප්‍රතිශේධනාත්මක පක්ෂ අවයවයකින් සප්‍රමාණ නිගමනයක් ලබා ගත නොහැක්කේ මන්දැයි සංවාක්‍ය පිළිබඳ ප්‍රධාන රීතීන් ඇසුරින් පැහැදිලි කරන්න.

2.සංවාක්‍ය පිළිබඳ ප්‍රධාන ප්‍රකාර සතරෙන් තුන්වෙනි ප්‍රකාරය දක්වා එහි සප්‍රමාණ උප ප්‍රකාර නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

3.පහත සඳහන් ඒවායින් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් හඳුන්වා දී ඒ එකකට එක් උදාහරණය බැගින් දෙන්න.

1.ශුද්ධ සෝපාධික සංවාක්‍යයක්
2.මිශ්‍ර සෝපාධික සංවාක්‍යයක්
3.මිශ්‍ර වියෝජක සංවාක්‍යයක්

4.පහත දැක්වෙන තර්ක සප්‍රමාණ සංවාක්‍යද නිෂ්ප්‍රමාණ සංවාක්‍යද යන්න නිගමනය කරන්න.තර්කය නිෂ්ප්‍රමාණ වන විට බිඳී ඇති රීතිය හෝ රීතීන් සඳහන් කරමින් සිදු වී ඇති ආභාසය/ආභාස නම් කරන්න.

1.සියලු ළමයින්වත් ගුරුවරුන්වත් කඩිසර නැති හෙයින් කිසිම ගුරුවරයෙක් ළමයෙකු නොවේ.

2.සිරිපාල බුද්ධිමත් නොවන්නේ හැම බුද්ධිමතෙක්ම ධනවත් වන නමුත් සිරිපාල ධනවත් නොවන බැවින්.

3.සියලු රියදුරන් නීතිගරුක රියදුරන් නොවන අතර ඇතැම් රියදුරන් විනයගරුක රියදුරන් නොවේ.එහෙයින් විනයගරුක රියදුරන් නීතිගරුක රියදුරන් නොවේ.

4.සමහර සිවුපාවුන් ක්ෂීරපායී වන හෙයින් හා කිසිම උරගයෙකු සිවුපාවෙකු නොවන හෙයින් සමහර ක්ෂීරපායීන් උරගයින්ය.

5.නව බදු කර්මාන්තවලට හානි වන අතර නව බදු සාමාන්‍ය ජනතාවට හොඳය.එම නිසා කර්මාන්තවලට හානි වන සියලු දේ සාමාන්‍ය ජනතාවට හොඳය.